# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 44 දරන අම්බුලුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 අගෝස්තු මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 අගෝස්තු මස 21 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

**2009 අංක 44 දරන අම්බුලුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල පනත**

[සහතිකය සටහන් කළේ 2009 අගෝස්තු මස 21 වන දින]

එල්.ඩී.—ඕ. 57/2005.

**අම්බුලුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන භාර අරමුදලක් පිහිටුවීම පිණිස ද, එහි අරමුණු හා බලතල නිශ්චය කිරීම පිණිස සහ ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 44 දරන අම්බුලුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "අම්බුලුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. අම්බුලුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණ භාර අරමුදල පිහිටුවීම.

(2) අරමුදල (1) වන උප වගන්තියේ ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් වන අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, ඒ නාමයෙන් අරමුදල විසින් නඩු පැවරීම ද, අරමුදලට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

3. (1) අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි සංස්ථාපනය කරන ලද භාරකාර මණ්ඩලයක් වෙත පැවරිය යුතු ය. අරමුදල් භාරකරුවන්ගේ මණ්ඩලය.

(2) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලේ භාරකාර මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) අරමුදලේ නිර්මාතෘවරයා;

PL 004114 -2,840 (2009/06)

(ආ) පරිසර සහ ස්වභාවික සම්පත් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඇ) බුද්ධ ශාසන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ඈ) නිර්මාතෘවරයා විසින් (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) පත් කළ තැනැත්තන් සත් දෙනෙක්.

(3) නිර්මාතෘවරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය.

(4) මණ්ඩලයේ පත් කළ සාමාජිකයන් විසින් සභාපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස් විය හැකි ය.

(5) යම් තැනැත්තකු—

(අ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා නීතියක් යටතේ වස්තු භංගත්වයට පත් හෝ බුන්වත් තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබ නිදහස් නොකල වස්තු භංගත්වයට පත් හෝ බුන්වත් තැනැත්තකු නම්;

(ආ) සදාචාර විරෝධී අපචාරයකට සම්බන්ධ මාස හයකට නොඅඩු කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් දිය හැකි වරදක් සිදු කර ඇත්නම් ;

(ඇ) ශ්‍රී ලංකාවේ බලපවත්නා යම් නීතියක් යටතේ සිහි විකල තැනැත්තකු හෝ ඌන මානසිකත්වයක් ඇති අයකු වේ නම්,

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් දිගටම කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

(6) (7) වන සහ (8) වන ඡේදවල විධිවිධානවලට යටත්ව මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුගේ ධුර කාලය වසර තුනක් විය යුතු ය.

(7) මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ස්වකීය ධුර කාලය ඉකුත්වීමට පෙරාතුව අන්‍යාකාරයකින් තම ධුරය හිස් කරනු ලබන අවස්ථාවක දී ඒ සාමාජිකයා වෙනුවට පත් කරනු ලබන අනුප්‍රාප්තික සාමාජිකයා විසින් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ (පූර්වගාමියාගේ) ධුර කාලයෙන් ඉවත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(8) නිර්මාතෘවරයා විසින් කවර හෝ වේලාවක පත් කළ සාමාජිකයකු හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(9) මණ්ඩලයේ සභාපතිවරයා මණ්ඩලයේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති නම් පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් එක් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(10) මණ්ඩලයේ සාමාජිකයන් අතර අදහස් පිළිබඳ වෙනස්කම් පවතින අවස්ථාවකදී බහුතරයේ තීරණය අනුගම්‍ය බල සහිත විය යුතු ය.

(11) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත ලෙස සලකනු නොලැබිය යුතු ය.

(12) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් හතර දෙනකු විය යුතු ය.

(13) (10) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව. මණ්ඩලය විසින් එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් එහි කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

අරමුදලේ අරමුණු.

4. අරමුදලේ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුත්තේ ය :—

(අ) අම්බුලුවාව දිසානායක මුදියන්සේලාගේ ජයරත්න ආගමික මධ්‍යස්ථානය සහ ජෛව විවිධත්ව සංකීර්ණය ආරක්ෂා කර සංවර්ධනය කිරීම;

(ආ) අම්බුලුවාව කඳුපෙළ වටා ප්‍රදේශය වැඩි දියුණු කිරීම;

(ඇ) ප්‍රජාව අතර සාමය, හොඳහිත අවබෝධය සහ සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම;

(ඈ) අන්තර් ආගමික සංකලනය සහ සමාජ අනුකලනය ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම;

(ඉ) ශ්‍රී ලාංකිකයන්ගේ ආගමික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම;

(ඊ) ආගමික ක්ෂේත්‍රය පිළිබඳ ශ්‍රී ලාංකිකයන්ගේ දැනුම සහ අවබෝධය වර්ධනය කිරීම;

(උ) සමාජය තුළ ආර්ථිකමය සහ සමාජීයමය වශයෙන් අවාසි ලබන තැනැත්තන්ගේ වාසස්ථාන වැඩිදියුණු කිරීම සහ අනෙකුත් යටිතල පහසුකම් සැලසීම ඇතුළුව ඒ තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම;

(ඌ) බුද්ධිමත්ව බැංකුවල සහ වෙනත් මූල්‍ය ආයතනවල ආයෝජනයන් කිරීමට තැනැත්තන් උනන්දු කරවීම;

(එ) අරමුදලේ අරමුණුවලට සමාන අරමුණු ඇත්තා වූ දේශීය සහ විදේශීය ආයතන සමග සම්බන්ධතා ඇති කර ගැනීම;

(ඒ) අරමුදලේ කිසියම් අරමුණකට සමාන වන්නා වූ යම් ක්‍රියාවකට සම්බන්ධ වී සිටින යම් තැනැත්තකුට මූල්‍යමය හෝ අනෙකුත් සහාය ලබාදීම;

(ඔ) ශ්‍රී ලංකාව තුළ සහ විදේශයක ආගමික ක්ෂේත්‍රය පිළිබඳ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම;

(ඕ) මානව අයිතිවාසිකම් යුතුකම් සහ යුක්තිදාමයට ප්‍රවේශ ලබා ගැනීම පිළිබඳව ජනතාව අතරේ දැනුවත් බවක් ඇති කිරීම සඳහා වූ වැඩසටහන් සංවිධානය කිරීම;

(ක) පුද්ගලයන්ගේ ක්‍රීඩා සහ විනෝද කටයුතු පිළිබඳ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයීම;

(ග) සම පැවැත්මෙන් යුත් ආගමික ප්‍රතිපත්ති පදනම් කරගෙන ලෝක සාමය පිණිස ජාතිය මෙහෙයවීම සහ ඒ මගින් සැලසුම්ගත සංවර්ධනයක් වෙනුවෙන් මාර්ග ඇති කිරීම;

(ච) පොදු මිනිසාගේ සංවර්ධනය සහ සුභසාධනය සඳහා තරුණ ශ්‍රමිකයන් පුහුණු කිරීම;

(ජ) ගොවියන් ධෛර්යමත් කිරීම සහ ප්‍රජාව තුළ තරුණ ගොවි සංවිධාන පිහිටුවීම;

(ට) පූර්ව වෘත්තීය අධ්‍යාපනය සහ ක්‍රීඩා ක්ෂේත්‍රයේ පුහුණුවීම් සඳහා තරුණයන්ගේ විශේෂ අවධානය යොමු කිරීම;

(ඩ) සම්මන්ත්‍රණ, දේශනා සහ ප්‍රදර්ශන, ලොතරැයි ක්‍රම සහ අධ්‍යාපන චාරිකා මෙහෙයවීම;

(ණ) පුස්තකාල ආරම්භ කර පවත්වාගෙන යාම; සහ

(ත) පරම්පරාවෙන් දේශීය වෙදකම භාවිතයට සම්බන්ධවී සිටින තැනැත්තන්ගේ උනන්දුව සුරක්ෂිත කිරීම සහ ශ්‍රී ලංකාවට ආවේණික ඖෂධ සහ බෙහෙත් පැලෑටි ආරක්ෂා කිරීම.

අරමුදලේ මුද්‍රාව.

**5.** අරමුදලේ මුද්‍රාව—

(අ) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය;

(ඇ) මණ්ඩලයේ බලය ඇතිව ද මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිටදී ද හැර කවර වූ හෝ ලේඛනයකට අත්සන් තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ ලේඛනය අත්සන් කළ යුතු ය.

අරමුදලේ බලතල සහ කර්තව්‍යයන්.

**6.** (1) අරමුදලේ අරමුණු ක්‍රියාවට නැංවීම පිණිස අවශ්‍ය වන්නා වූ හෝ ආනුෂංගික වන්නා වූ සියලු දේ අරමුදලේ නමින් සිදු කිරීමට මණ්ඩලයට බලය ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරා දෙන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව මණ්ඩලයට පහත සඳහන් බලතල සහ කර්තව්‍යයන් තිබිය යුතු ය.

(අ) අරමුදල් රැස් කිරීම සහ දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් ප්‍රදානයන්, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම;

(ආ) මේ පනත යටතේ හෝ යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් මණ්ඩලය වෙත පැවරෙන යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීමට හා දැරීමට අරමුදලට බලය ඇති අතර, ඒවා විකිණීම, උකස් කිරීම, බදුදීම, ප්‍රදානය, පැවරීම, රික්ථවරණය කිරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඇ) අරමුදලේ පරමාර්ථ වැඩිදියුණු කිරීම උදෙසා, දේශීය හෝ විදේශීය ප්‍රදානයන්, පරිත්‍යාග හෝ ශිෂ්‍යත්ව ලබා දීම ;

(ඇ) අරමුදලේ පරමාර්ථ වැඩිදියුණු කිරීම සඳහා ලොතරැයි ක්‍රම පවත්වාගෙන යාම සහ තත්කාලයේ බලපවත්නා යම් නීතියකට යටත්ව මුදල් එක්රැස් කිරීම ;

(ඉ) අරමුදලේ පරමාර්ථ කරගෙන යාම සඳහා එහි බලතල, කාර්යය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් සියලු ගිවිසුම්වලට සහ එකගතාවයන්ට කෙලින්ම හෝ මණ්ඩලය විසින් තත්කාර්යය සඳහා ලිඛිතව බලය දෙන ලද නිලධරයන් සහ සේවකයන් නැතහොත් අනුයෝජිතයන් මාර්ගයෙන් ඇතුළත් වී ක්‍රියාත්මක වීම ;

(ඊ) අරමුදලට සේවය කිරීම පිණිස මේ පනතේ විධිවිධානවලට යටත්ව පාරිශ්‍රමික නිලධරයන් සහ සේවකයන් පත් කිරීම සහ එහි සේවා නියුක්තිකයන්ගේ පත් කිරීම්, උසස් කිරීම්, පාරිශ්‍රමික ගෙවීම් සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම සහ ඔවුන් සඳහා නිවාඩු සහ වෙනත් ප්‍රතිලාභ ප්‍රදානය කිරීම ;

(උ) අරමුදලට අයිති හෝ අරමුදල විසින් දරනු ලබන යම් ඉඩමක කිසියම් ගොඩනැගිල්ලක් හෝ සැකිල්ලක් ඉදි කිරීම හෝ එසේ ඉදිකිරීමට සැලැස්වීම ;

(ඌ) භාර මුදල් ද ඇතුළුව අරමුදලට අයිති මුදල්, මණ්ඩලයේ ද කැමැත්ත ඇතිව, මුදල් ආයෝජනය කිරීම සඳහා නීතියෙන් බලය දෙන ලද කිසියම් ආයෝජනයකට යෙදවීම සහ නැවත ආයෝජනය කිරීම සහ ඒ ආයෝජකයන් වෙනස් කිරීම, මණ්ඩලයේ කැමැත්ත පරිදි අවලංගු කිරීම සහ ඒ ආයෝජකයන්ගෙන් උපචිත වූ ආදායම එකතු කිරීම; සහ

(එ) බැංකු ගිණුම් ආරම්භ කර ක්‍රියාත්මක කිරීම සහ වසා දැමීම ද අරමුදලේ කාර්යයන් සඳහා අරමුදලේ දේපළ ඇපයක් ලෙස තබා නැතහොත් එවැනි ඇපයක් නොමැතිව මුදල් ණයට ගැනීම සහ මුදල් වැඩිකර ගැනීම.

අරමුදලට කරන ගෙවීම්.

**7.** පහත දැක්වෙන මුදල් අරමුදලට ගෙවනු ලැබ තිබිය යුතු ය :-

(අ) අරමුදලේ නමින් මහා භාරකාරවරයා යටතේ පවතින සියලු මුදල් සහ අම්බුලුවාව පරිසර සංවර්ධන සහ සංරක්ෂණ භාර අරමුදලේ නමින් බැංකුවල පවතින මුදල්;

(ආ) දේශීය හෝ විදේශීය මාර්ගවලින් ලබා ගත් හෝ රැස්කර ගත් මුදල් කිසිවක් හෝ ලැබුන ප්‍රදානයන්, ත්‍යාග හෝ පරිත්‍යාග;

(ඇ) අරමුදලේ අරමුණු සහ පරමාර්ථ ඉටු කර ගැනීමේ කාර්යය සඳහා කලින් කලට රජයෙන් ලබා ගත් ප්‍රදාන; සහ

(ඈ) ආයෝජනවලින් හෝ වෙනත් ලැබීම්වලින් අරමුදලට අයවිය යුතු ආදායම් කිසිවක්.

අරමුදලෙන් කරනු ලබන ගෙවීම්.

**8.** අරමුදලෙන්—

(අ) අරමුදල පිහිටුවා පවත්වා ගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වියදම් ;

(ආ) නිලධරයන්ගේ, සේවකයන්ගේ සහ අනෙකුත් සේවා නියුක්තිකයන්ගේ පඩි ගෙවීම ; සහ

(ඇ) අරමුදලේ පරමාර්ථ ඉටුකරගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ අරමුදල මගින් අනුමත කරන වෙනත් යම් සියලු ගෙවීම්,

කරනු ලැබිය යුතු ය.

අරමුදලේ භාර ගිවිසුම් ආදිය එකී අරමුදලේ ඒවා ලෙස සැලකිය යුතු බව.

**9.** මේ පනත ක්‍රියාත්මක වන කාලය වන විට එකී භාර අරමුදලේ පවතින සියලු ගිවිසුම්, එකඟතා, ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන අරමුදලේ ගිවිසුම්, එකඟතා, ණය සහ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය.

**10.** (1) මණ්ඩලය විසින් එහි ආදායම සහ වියදම වත්කම් හා බැරකම් සහ අරමුදලේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) මණ්ඩලය විසින් එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දින වන විට එහි ගිණුම් පොත්වල ශේෂය ගණනය කරනු ලැබීමට සැලැස්විය යුතු අතර, ඊළඟ වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනට පෙරාතුව, ආදායම් සහ වියදම් ගිණුම් සහ පළමුව සඳහන් කරන ලද දිනයට සකස් කළ යුතු අරමුදලේ වත්කම් සහ බැරකම් පිළිබඳ සංක්ෂේපයන් ඇතුළත් ශේෂ පත්‍රයන් සකස් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(3) යෝජනා සම්මතයක් මගින් මණ්ඩලය විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු විසින් මණ්ඩලයේ ආදායම් හා වියදම් ගිණුම් සහ ශේෂ පත්‍රය අත්සන් කරනු ලැබිය යුතු ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව සෑම අවුරුද්දකම අරමුදලේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

**11.** අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. අරමුදලේ මුදල් වර්ෂය.

**12.** මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් අරමුදලේ අරමුණු සහ පරමාර්ථ ක්‍රියාත්මක කර ගැනීම සඳහා පහසුකම් සැලැස්වීම පිණිස අරමුදලේ ආදායම් හෝ ලාභය මත ගෙවිය යුතු යම් ගාස්තුවක්, අයවීමක් සහ යම් බද්දක් අවස්ථාවෝචිත පරිදි 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ නියමයන්ට අනුකූලව හෝ ඒ ගාස්තුව, අයකිරීම හෝ බද්ද පනවන කාලයේදී බලපවත්වන වෙනත් යම් ලිඛිත නීතියක නියමයන්ට අනුකූලව අවසර දිය හැකි යම් ප්‍රමාණයකට ගෙවීමෙන් අරමුදල, ඒ ගාස්තුව, අයවීම හෝ බද්ද ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය. ගාස්තු ගෙවීමෙන් අරමුදල් නිදහස් බව.

**13.** (1) යම් අධිකරණයක් ඉදිරිපිට දී අරමුදල විසින් හෝ අරමුදලට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් අරමුදල විසින් දරන ලද වියදම් කිසිවක් අරමුදලින් වියදම් ප්‍රතිපූරණය කිරීම.

ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවකින් අරමුදලට ලැබුන හෝ අරමුදල විසින් අයකර ගත් යම් මුදලක් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් එවැනි යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ නඩුවේ දී ඔහු විසින් දරන ලද යම් වියදමක් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

අරමුදලේ නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**14.** අරමුදලේ සියලු නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අරමුදල අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**15.** අරමුදල අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ කරගනු ලැබිය යුතු ය.

නිර්මාතෘවරයාගේ අනුප්‍රාප්තිය.

**16.** නිර්මාතෘවරයා මිය ගිය අවස්ථාවක දී, නිර්මාතෘවරයාගේ පුතා වන තැනැත්තා නිර්මාතෘවරයාගේ ධුරයට අනුප්‍රාප්ත විය යුතු අතර, ඉන් පසුව පරම්පරාවෙන් පැවත එන වැඩිමහල් පිරිමි තැනැත්තකු අනුප්‍රාප්තිකයා විය යුතු ය.

ඔප්පුවේ විධිවිධානවල යම් පරස්පර විරෝධීතාවයක දී මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු බව.

**17.** අම්බුලුවාව පරිසර සංවර්ධන සහ සංරක්ෂණ භාර අරමුදලේ ඇතුළත් කිසිවක කුමක් සඳහන් වුව ද, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර, මේ පනතේ විධිවිධාන සහ අම්බුලුවාව පරිසර සංවර්ධන සහ සංරක්ෂණ භාර අරමුදලේ විධිවිධාන අතර යම් පරස්පර විරෝධතාවයක් ඇති වන අවස්ථාවක දී ඒ අනුව මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

**18.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**19.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

අර්ථ නිරූපණය.

"අම්බුළුවාව පරිසර සංවර්ධන සහ සංරක්ෂණ භාර අරමුදල" යන්නෙන්, ගරු දිසානායක මුදියන්සේලාගේ ජයරත්න යන අය ද, එහි කළමනාකාර භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් වන තැනැත්තන් සහ (88 වන අධිකාරය වූ) මහාභාරකාර ආඥාපනත යටතේ සංස්ථාපිත මණ්ඩලයක් වූ ශ්‍රී ලංකා මහා භාරකාර මණ්ඩලය අතර 2000 සැප්තැම්බර් මස 1 වන දින නුවර දී ඇතිකර ගත් හා ගිවිසගත් ප්‍රතිඥා පත්‍රය සහ විශ්වාස භාර ප්‍රකාශය අදහස් වේ ; සහ

"නිර්මාතෘවරයා" ගරු දිසානායක මුදියන්සේලාගේ ජයරත්න විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.